ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,513 - 2026 ඔක්තෝබර් මස 30 සිකුරාදා - 2026.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
තනතුරු ඇබෑර්තු	1368
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩු බාහිරාදිය විකිණීම	—
පළාත් පාලන නිවේදන	—
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	1381

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 20 පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 නොවැම්බර් මස 06 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1367 - B 082844— (2026/10)
F 1 -

තනතුරු ඇබෑර්තු

මහනුවර මහා නගර සභාව

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර හා සුභසාධන දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ උඩරට නර්ත පුහුණු ව්‍යාපෘතියේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක කාර්යයන් ඉටුකර ගැනීමේ සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර **2026.11.13** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උඩරට නතර්න උපදේශක සේවය

1. මිලදී ගැනීමට නියමිත සේවාව : ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත නර්තන උපදේශක සේවය සපයා ගැනීම

2. මාසික දීමනාව : පුහුණුව ලබාදෙන පැයක් සඳහා රු. 500 බැගින් සඳුදා සිට සිකුරාදා දක්වා දිනකට පැය 03 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ භාෂාව සහ නර්තන විෂය යන විෂයයන් 02 සඳහා සම්මාන සහිතව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. මින් විෂයයන් 5ක් එක් වරකදී සමත් ව තිබිය යුතුය.

5. වෘත්තීය සුදුසුකම් : තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් නර්තනය සම්බන්ධයෙන් වසරක් හෝ ඊට වැඩි කාල සීමාවක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

6. පළපුරුද්ද : යටත් පිරිසෙයින් ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක් වත් පළපුරුද්ද ලබා තිබීම

7. වෙනත් සුදුසුකම් :
   අ. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
   ආ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට වැඩි හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
   ඇ. බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   ඈ. කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම් කළ යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයකු පහත කොන්දේසිවලට යටත් ව සේවයට තෝරාගනු ලැබේ:-

   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත තනතුරු සංඛ්‍යාව 01 කි.
   - මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන අතර, අදාළ සුදුසුකම් සපිරූ අයදුම්පත්‍ර නොමැතිනම් අනෙකුත් ප්‍රදේශවල අයදුම්පත්‍ර සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.
   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

9. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය, සේවාව ලබා ගැනීම ආරම්භ කරන දින සිට මාස 06කි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.
- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
- තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත් වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදු කළ යුතුය.
- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.
- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමග සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

සටහන : මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ඔක්තෝබර් මස 30 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර හා සුභසාධන දෙපාර්මේන්තුව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත උඩරට නර්තන උපදේශක සේවය ලබා ගැනීම

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: .....

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : .....

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : .....

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): .....

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. උපන්දිනය :- වර්ෂය : .....මාසය: ..... දිනය: .....

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.11.13 දිනට) වයස: අවුරුදු.....මාස..... දින.....

06. ස්ත්‍රී පුරුෂ භාවය : .....

07. විවාහක / අවිවාහක භාවය : .....

08. ස්ථිර ලිපිනය : .....

09. දුරකථන අංකය : .....

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : .....

එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව:.....

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පොෙ.ස.(සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති ශ්‍රේණිය*
01		
02		
03		
04		
05		
06		
07		
08		
09		
10		

11. (II) අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය : .....
විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති ශ්‍රේණිය*
01		
02		
03		
04		

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :

වෘත්තීය සුදුසුකම් :
.....
. .....
.....
.....

පළපුරුද්ද :
.....
. .....
.....
.....

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

.....,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....

10-823

කුරුණෑගල මහා නගර සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ III ශ්‍රේණියේ රියදුරු (විවෘත) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

1. කුරුණෑගල මහා නගර සභාවේ පවතින ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ රියදුරු තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු 09 ක් සඳහා බඳවා ගැනීමට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පදිංචි බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාවය තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් අදාළ පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3. කුරුණෑගල මහා නගර සභාවේ රියදුරු පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

(***සංලක්ෂ්‍යය .-*** මෙම බඳවා ගැනීම කුරුණෑගල මහා නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සත අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු වලට අදාළව රියදුරු රාජකාරි ඉලක්ක කරගෙන සිදු කරනු ලැබේ.)

4. වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 10/2025 අනුව මාසික වැටුප් පරිමාණය PL 3 - 2025 - රු. 42,780 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540 වේ.

5. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය සේවකයින් සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔවුන් යටත් විය යුතුවේ.

6. තව ද ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට නිලධාරීන් විසින් ඒ මුදල් ගෙවිය යුතුය.

7. ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ රියදුරු III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් අදාළ වේ..

(අ) **අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො. ස (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 6 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වරකදී විෂයයන් 5ක් සමත් විය යුතුය.

(ආ) **වෘත්තීය සුදුසුකම් :**

i. ශිල්පීය නිපුණතා : තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රෙලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රය)

ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

(ඇ) **පළපුරුද්ද :**

වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.)

(ඈ) **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

ii. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් විය යුතුය.

iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථීර පදිංචිය සනාථ කළ යුතු වේ.

iv. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

v. ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදු කරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.

vi. යම් අපරාධ නීති කෘත්‍යකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 449 වන වගන්තිය ප්‍රකාරව අධිකරණයකදී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.

(ඊ) **වයස් සීමාව :**

වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

8. **බඳවා ගැනීමේ ක්‍රමය :**

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තනතුරට අදාළ වන පරිදි වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලබන අතර තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය හා බඳවා ගන්නා සංඛ්‍යාව පිළිබඳ අවසන් තීරණය කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

9. සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ නිර්නායකයන් :

- **මූලික අධ්‍යාපන සුදුසුකම් :**

I.	අ.පො.ස. (සා.පෙළ) සාමාන්‍ය සාමාර්ථයක් සඳහා	ලකුණු 05
II.	අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා	ලකුණු 08
III.	අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා	ලකුණු 10

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ උපරිම වශයෙන් විෂයයන් 05 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. ඒ අනුව ලැබෙන උපරිම ලකුණු සංඛ්‍යාව — ලකුණු 50

- **වෘත්තීය සුදුසුකම් සඳහා :**

I.	තනතුරට අදාළ වන ශිල්පීය දැනුම (න්‍යායාත්මකව)	ලකුණු 25	
II.	තනතුරට අදාළ වන ශිල්පීය දැනුම (ප්‍රායෝගික)	ලකුණු 25	
	වෘත්තීය සුදුසුකම් සඳහා උපරිම ලකුණු සංඛ්‍යාව		ලකුණු 50
	මුළු ලකුණු සංඛ්‍යාව		ලකුණු 100

10. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**

මේ සමග ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් සකස් කළ අයදුම්පත 2026.11.13 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑල මගින් නාගරික කොමසාරිස්, මහා නගර සභාව, කුරුණෑගල යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ලිපි කවරයේ වම්පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

11. අයදුම්පත සමඟ එවිය යුතු ලේඛන:

පහත ලේඛනවල තමා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

I. උප්පැන්න සහතිකය;
II. ජාතික හැඳුනුම්පත;
III. රියදුරු බලපත්‍රය;
IV. අධ්‍යාපන සහතික;
V. පදිංචි සහතිකය;
VI. වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්වලට අදාළ සහතික.

12. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්කරු විසින් එවන ලද අයදුම්පත්‍ර යේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13. නියමිත වයස් සීමාවට අයත් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම අයදුම්පත් ලද බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

ඩබ්. එම්. පී. ජී. වීරසිංහ,
නාගරික කොමසාරිස්,

2026 ඔක්තෝබර් මස 30 වැනි දින,
මහා නගර සභාව,
කුරුණෑගල.

ආදර්ශ අයම්පත්‍රය

වයඹ පළාත් රාජ්‍ය සේවයේ කුරුණෑගල මහා නගර සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ III ශ්‍රේණියේ රියදුරු (විවෘත) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

01. මුලකුරු සමග නම : .....

02. මුලකුරු වලින් හැඳින්වෙන නම : .....

03. ස්ථිර ලිපිනය : .....

04. ජාතික හැඳුනුම්පත් අංකය :.....

05. ස්ත්‍රී/පුරුෂ භාවය: .....

06. උපන්දිනය :- වර්ෂය : ..... මාසය: ..... දිනය: .....

07. අයදුම්පත් කැඳවන දිනට වයස: අවුරුදු: .....මාස :..... දින :.....

08. දුරකථන අංකය : .....

09. අධ්‍යාපන සුදුසුකම් :

අවසන් වර සමත් වසර :

අ.පොෂ.(සාමාන්‍ය පෙළ) විභාගය :

පළමු වර සමත් වර්ෂය : ..... විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*සාමාර්ථය*	*අනු. අංකය*	*විෂයය*	*සාමාර්ථය*
01			06		
02			07		
03			08		
04			09		
05			10		

දෙවන වර සමත් වර්ෂය : ..... විභාග අංකය : .....

අනු. අංකය	*විෂයය*	*සාමාර්ථය*	*අනු. අංකය*	*විෂයය*	*සාමාර්ථය*
01			06		
02			07		
03			08		
04			09		
05			10		

10. වෘත්තීය සුදුසුකම් :

ශිල්පීය නිපුණතා : තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රෙලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබේද?

ඔව්/නැත

11. පළපුරුද්ද :

වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබේද?

ඔව්/නැත

12. ඔබ කවරදාක ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදු කරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු හෝ යම් අපරාධ නීති කෘත්‍යකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වන වගන්තිය ප්‍රකාරව අධිකරණයකදී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තකු කරනු ලැබ තිබේද?

ඔව්/නැත

13. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙක් වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....

10-747

පළාත් පාලන නිවේදන

හපුතලේ නගර සභාව

2027 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සැලසීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 178 වගන්තියෙන් නියම කර ඇති පරිදි හා එම පනතේ 193 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් සාදන ලද රීති අනුව මා විසින් හපුතලේ නගර සභාවට අදාළ 2027 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අයවැය ලේඛනයේ කෙටුම්පත 2026.10.21 දින සිට හපුතලේ නගර සභා කාර්යාලයේ දී මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා අවස්ථාව සලසා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපුල් දිසානායක,
සභාපති,
නගර සභාව,
හපුතලේ.

2026 ඔක්තෝබර් මස 19 වැනි දින.

10-800

ගම්පහ මහා නගර සභාව

2027 වර්ෂය තුළ මස් මාංශ වෙළඳසැල් වසා තැබීම

2027 වර්ෂය සඳහා පෝය දිනවල හා සත්ව දිනයේ දී මස් මාංශ අලෙවි සැල් වසා තැබීම සම්බන්ධව ගම්පහ මහා නගර සභාව විසින් 2026.09.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් නිර්දේශ කර 2026.10.08 දින පැවති මහා සභා රැස්වීමේ දී තීරණ අංක 476 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. ආර්. ඩී. රත්නායක,
නාගරික කොමසාරිස් (රා.ඉ.)
ගම්පහ මහා නගර සභාව.

2026 ඔක්තෝබර් මස 12 දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ 2027 වර්ෂයේ යෙදෙන පහත සඳහන් සියලුම පෝය දිනවල හා ලෝක සත්ත්ව දිනය යෙදෙන ඔක්තෝබර් මස 04 දිනය මස් මාංශ අලෙවිසැල් වසා තැබිය යුතු යැයි තීරණය කරමි.

ජනවාරි 22
පෙබරවාරි 20
මාර්තු 22
අප්‍රේල් 20
මැයි 19
ජුනි 18
ජූලි 18
අගෝස්තු 16
සැප්තැම්බර් 15
ඔක්තෝබර් 04
ඔක්තෝබර් 15
නොවැම්බර් 13
දෙසැම්බර් 13

10-801

මීගමුව මහා නගර සභාව

2026 පරිපූරක අයවැය ඇස්තමේන්තුව අංක 02

මීගමුව මහා නගර සභාවේ 2026 වර්ෂයේ නොවැම්බර් මස ඉදිරිපත් කළ යුතු 2026 වර්ෂයේ අංක 02 දරන පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2026.10.30 දින සිට 2026.11.09 දින දක්වා වැඩ කරන දින 07 ක් මහජන පරීක්ෂාව සඳහා නාගරික ගණකාධිකාරි දෙපාර්තමේන්තුවේ තබා ඇති බව 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 214 (ආ) වගන්තිය යටතේ දැනුම් දෙමි.

ඩබ්. ඊ. දුලිප් වාමර ප්‍රනාන්දු,
නගරාධිපති,
මීගමුව මහා නගර සභාව.

10-854

සොරණාතොට ප්‍රාදේශීය සභාව

2027 වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය පරීක්ෂා කර බැලීම වෙනුවෙන් මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුගතව හා ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ 2020.10.29 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව සකස් කරන ලද 2027 වර්ෂයෙහි කෙටුම්පත් අයවැය ලේඛනය 2026.10.31 දින සිට 2026.11.07 වන දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා කාර්යාල පරිශ්‍රයෙහි තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. ඩී. අසෝක කීර්ති ජයලත්,
සභාපති,
සොරණාතොට ප්‍රාදේශීය සභාව.

10-744

මාතර මහා නගර සභාව

මාර්ග උපලේඛනය

1987 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය අනුව හා 1989 අංක 12 දරන පළාත් සභා පනතේ (ආනුෂංගික විධිවිධාන පනතේ) 2(1) (අ) වගන්තිය ප්‍රකාරව, ගරු ආණ්ඩුකාර විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාරව, පහත උපලේඛනයේ විස්තර කර ඇති පරිදි නව මාවත නම් කරනු ලැබ ඇති බැව් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නෙලුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2026 ඔක්තෝබර් මස 19 දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අංකය	*පළාත් පාලන ආයතනයේ නම*	*දිස්ත්‍රික්කය*	*වීථියේ වර්තමාන නම*	*අලුතින් යොදා ඇති නම*	*මාර්ග විස්තරය*
01	මාතර මහා නගර සභාව	මාතර	-	කැත්ලින් මේබල් විජේසිංහ මාවත	අමරසිරි ගුණවඩු මාවතේ අංක 43A නිවස අසල සිට රේන්දගෙවත්ත අංක 01 ඉඩම

10-822

පන්නල ප්‍රාදේශීය සභාව

මහජනතාව වෙත කෙරෙන විශේෂ නිවේදනයයි

2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති අංක 10/2/ආ අනුව පන්නල ප්‍රාදේශීය සභාවේ 2027 අයවැය කෙටුම්පත පරීක්ෂා කර බැලීමේ අවස්ථාව ඔබ හට සලසා දීමට අප විසින් කටයුතු කර ඇති අතර ඒ අනුව පන්නල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය, පන්නල උප කාර්යාලය, යක්විල උප කාර්යාලය, මාකඳුර උප කාර්යාලය හා ගිරිඋල්ල උප කාර්යාලය වෙත පැමිණ එම අයවැය කෙටුම්පත පරීක්ෂා කර බැලිය හැකි බව ඔබ වෙත කාරුණිකව දැනුම් දෙමි.

එස්. එම්. නන්දන සිරි පරාක්‍රම,
සභාපති,
පන්නල ප්‍රාදේශීය සභාව.

2026 ඔක්තෝබර් මස 21 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

10-829

මැදගම ප්‍රාදේශීය සභාව

2027 වර්ෂයට අදාළව සකස් කරන ලද අයවැය කෙටුම්පත් ලේඛනය මහජන ප්‍රදර්ශනයට තැබීම සඳහා වූ දැන්වීම

2027 වර්ෂය සඳහා මැදගම ප්‍රාදේශීය සභාවේ සකස් කරන ලද අයවැය කෙටුම්පත් ලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා මැදගම ප්‍රාදේශීය සභාවේ සහ මැදගම, නන්නපුරාව, අමුණේකඳුර යන පුස්තකාලවලදී මහජනතාවට අවස්ථාව සලසා ඇති බව මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට කාරුණිකව දන්වා සිටිමි.

ආර්. එම්. ඒ. පී. රත්නායක,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2026 ඔක්තෝබර් මස 13 දින,
මැදගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී ය.

10-838

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

2027 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීමට අවස්ථාව සැලසීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් 2020.10.29 දින ගැසට්පත් අංක 2199/25 මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2)(ආ) ප්‍රකාරව, 2027 වර්ෂය වෙනුවෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව විසින් ඉදිරිපත් කිරීමට නියමිත කෙටුම්පත් අයවැය ලේඛනය 2026.10.23 වන දින සිට වැඩකරන දින 07 ක් දක්වා කාර්යාල වේලාව තුළ මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ දී අවස්ථාව සලසාදෙනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩී. වසන්ත සංජීව සෝමසිරි,
සභාපති,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

10-845

මාතලේ මහ නගර සභාව

අයවැය කෙටුම්පත 2027

මහ නගර සභා ආඥාපනතේ 212(ආ) වගන්තිය යටතේ සිදු කරන නිවේදනයයි
(252 අධිකාරිය)

2027 වර්ෂයේ මාතලේ මහ නගර සභාවේ අයවැය කෙටුම්පත 2026 නොවැම්බර් මස 01 වන දින සිට 2026 නොවැම්බර් මස 07 දින දක්වා කාර්යාල වේලාවන් තුළ මාතලේ මහ නගර සභා කාර්යාලයේ සහ මහජන පුස්තකාලයේ දී මහජනතාවගේ පිරික්සුම සඳහා තබන බව මෙයින් දැනුම් දෙමි.

අශෝක අජිත් කොට්ටහව්වි,
නගරාධිපති,
මහ නගර සභාව - මාතලේ.

2026 ඔක්තෝබර් මස 30 දින,
මහ නගර සභා කාර්යාලයේදී ය.

10-846